මැණික් හා ස්වර්ණාභරණ
පර්යේෂණ හා අභ්‍යාස
ආයතනය

හිදැල්ලන, රත්නපුර.

GJRTI

# වාර්ෂික වාර්තාව
# 2011



GJRTI

මැණික් හා ස්වර්ණාභරණ
පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
හිදැල්ලන
රත්නපුර.
2012.08.29

ගරු පරිසර අමාත්‍යතුමා,
පරිසර අමාත්‍යාංශය,
සම්පත්පාය,
නො 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

## <u>වාර්ෂික වාර්තාව 2011</u>

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2011 වර්ෂය සඳහා වු මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තාව.

2. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු ආයතනයේ ආදායම් හා වියදම් වාර්තාව, 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3. 2011 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී,

...............................................
ෆයිසාල් රශින්
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ
හා අභ්‍යාස ආයතනය

## දැක්ම

**"මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම."**




## මෙහෙවර

**" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේශණ කටයුතු, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩිකිරීමට අදාල ශිල්පීය හා තාක්‍ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහිකිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු, සඟරා, පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි."**

## 2. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

### 2.1 2011 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 01 | ෆයිසාල් රශීන් මහතා (සභාපති) | 2008.07.15 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල සභාපති |
| 02 | ඉන්ද්‍රජිත් අපෝන්සු මහතා | 2010.05.14 දින සිට අද දක්වා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 03 | මහාචාර්ය එන්.පී. විජයානන්ද මහතා | 2008.04.23 දින සිට අද දක්වා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(සභාපති-භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය) |
| 04 | ගයනි කෞශල්‍යා විජේසිංහ මිය | 2011.03.23 දින සිට 2011.08.08 දක්වා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත) |
| 05 | ඒ.ඩී.ඒ.කේ. නන්දසේන මිය | 2011.09.29 දින සිට අද දක්වා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත) |

### 2.2 ඉහළ කළමණාකාරිත්වය

තිලක් ධර්මරත්න ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
( B.Sc, M.Sc in Gemmology (SL), M.Sc (UK) (2000.08.01 – අද දක්වා)

## 3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

### 3.1 අවස්ථා

**පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම**

ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ. මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ග හරහාද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත. මෙම ක්ෂේත්‍රයට අදාලව සම්පූර්ණ පරාසය තුල පුහුණු සේවාවන් ලබා දෙන වෙනත් කිසිදු ආයතනයක් නොමැත. එසේම මෙම කර්මාන්තයට අවශ්‍ය පර්යේෂණ අවශ්‍යතා සපුරාගෙන සේවා සපයන්නෙකු ද කලාපය තුල නොමැත. එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගනිමින් තිබෙන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොල අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත.

**සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත. මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ, ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම, ප්‍රාථමික මැණික් නිධි ලබා ගැනීමේ තාක්ෂණය සැලසුම් කිරීම හා සැකසීම, සහ පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ සහ නිෂ්පාදනය වෙනුවෙන් පුහුණුව ලබාදීම ද ඇතුලත් වේ.

**තාක්ෂණික අභිවර්ධනය**

මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත.

**ආයතනයේ දියුණුව**

ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබාදීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ විශ්ව විද්‍යාලයක් මට්ටමට මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යාවය ද ඇත.

**වෙනත් පහසුකම්**

ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මගින් ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අසමසම මට්ටමක ආයතනය පවතී.

**කර්මාන්තයේ දියුණුව සඳහා සංධිය වැඩසටහන්**

පරිසර අධිකාරීන් සමඟ මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ පර්යේෂණ ව්‍යාපෘති සඳහාද, වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහාද සහ සම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත.

**ප්‍රචාරක වැඩසටහන්**

ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කල යුතුව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, මැණික් හා ස්වර්ණාභරණ සඟරා සහ පුවත් පත්‍රිකා, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය යොදාගත හැක.

## 3.2 <u>අභියෝග</u>

**යටිතල පහසුකම්**

පුහුණු ඒකක වල ප්‍රමාණවත්ව නවීන පහසුකම් හා යන්ත්‍ර උපකරණ සංවර්ධනය වී නොමැත. එවැනි උපකරණ මෙම පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට  අවශ්‍ය පුහුණුවලට අදල දැනුම හා කුසලතාවය ලබා දිමට කඩිනම් පියවර ගත යුතු වේ. ස්වර්ණාභරණ පුහුණු ඒකකවල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ. තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත. දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක්  වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබාදීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා

පියවර ගතයුතු වේ. තවද විදුලි උදුන් භාවිතයෙන් මැණික් වල වර්ණ වැඩි දියුණු කිරීමේ නව ක්‍රම වේදයන් හදුන්වා දීමේ හැකියාව මෙම ආයතනය සතුව පැවතියද එම තාක්ෂණික උපකරණ හිඟය මේ සඳහා බලපා ඇත.

**භෞතික සම්පත්**

ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරනාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන වල උපකරණ වල හිඟකමක් දක්නට ඇත.

**සේවකයන්ගේ දුර්වල ආකල්ප**

මෑත අතීතයේ සේවකයන් තුල සෘණාත්මක ආකල්පමය මානසික පසුබිමක සිටීම.

**සහෝදර ආයතන මගින් අපගේ සේවාවන්ම සිදුකිරීම**

උදාහරණ:- අපගේ පුහුණු, රසායනාගාර සේවා ආදිය.

**මානව සම්පත්**

කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සකස් කරන ලද ආයතනයේ නව සේවක සැලැස්ම, බඳවාගැනීමේ පටිපාටිය, උසස්වීම් පටිපාටිය සඳහා 2011 වර්ෂයේදී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබිනි.

එසේ වුවද ආයතනයේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන අවම කාර්ය මණ්ඩලය බඳවාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබානොදීම හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි වී ඇත. එය ආයතනයේ අරමුණු ඉටුකරගැනීමට බාධාවක් වී ඇත.

ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම නිසා සහ සිටින නිළධාරීන් සීමිතවීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමුකිරීමට ඇති අවස්ථාවන් අවමවීම නිසා එම කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුමට සරිලන ලෙස සුදානම් කිරීමට නොහැකි වී ඇත. එය කර්මාන්තයේ අනාගතයට අහිතකර ලෙස බලපාන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම

පහලයාමට බලපෑ හැකිය. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා විදේශීය පුහුණු අවස්ථාවන් නොමැතිවීමද මෙම තත්වය තවදුරටත් අහිතකර වී ඇත.

මෙම තත්වය අමාත්‍යාංශය මගින් මහාභාණ්ඩාගාරය වෙත දිගින් දිගටම දැනුවත් කර ඇති අතර ඉදරි වර්ෂයේදී ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාගෙන අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ දැනට සිටින කාර්ය මණ්ඩලය අදාල පුහුණු වැඩසටහන් සඳහා යොමුකිරීමට අපේක්ෂාවෙන් සිටි.

**මුල්‍ය සම්පත්**

වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරනාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් දායකත්වයක් මහාභාණ්ඩාගාරය වෙතින් නොලැබේ. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් ආයතනයේ ප්‍රධාන කාර්‍යයන් ඉටුකිරිම සඳහා අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනිම සඳහා මුල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී නොමැත.

**පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම -**

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

**කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම -**

උදාහරණ:- සේවා කැපුම් අංශය

**භූ විද්‍යාඥයන්ගේ හා පුහුණු විශේෂඥයන්ගේ හිඟකම**

**පර්යේෂකයන්ට සහ පුහුණු කරුවන්ට උසස් පුහුණු කටයුතු සඳහා අවස්ථාවන් නොමැති කම සහ අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ හා පුහුණු සහ අනෙකුත් ආධාරක කාර්‍යය මණ්ඩලය අතර සේවක පරතරයක් පැවතිම**

## 4. <u>අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව</u>

### 4.1 <u>අරමුණු</u>

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව 1995 ජුලි 28 දිනැති හා අංක 882 ගැසට්

නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබිය. ආයතනයේ ප්‍රධාන අරමුණු වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරිම, වැඩි දියුණු කිරිම හා සංවර්ධනය කිරිමයි.

## 4.2 ආයතනයේ බලතල

1995 ජුලි 28 දිනැති අංක 882 දරණ ගැසට් පත්‍රය මගින් ආයතනයට පවරා ඇති බලතල පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ හා එම නිධි පිලිබඳව සමීක්ෂණය කිරිම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරිම

- i ඒවායේ පිහිටීම
- ii හඳුනා ගැනීම
- iii මැණික් ගල් අනර්ගිකරණය කරන ක්‍රම
- iv ආයතනයට සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර වල කටයුතු

(ii) පතල් කැපීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ මැණික් පිරියම් ක්‍රම යන අංශ වලට අදාලව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලු තාක්ෂණික හා අනෙකුත් උපදෙස් ලබාදීම.

(iii) පහත සඳහන් පුහුණුව ලබා දීම.

- i මැණික් කැපීම
- ii ස්වර්ණාභරණ නිෂ්පාදනය
- iii දියමන්ති ඇතුලු රත්න විද්‍යාව
- iv ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය
- v මැණික් ගල් අනර්ගිකරනය හා ගෙවුඩ තාපකරණය ඇතුලුව
- vi මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත වලට සම්බන්ධ අනෙකුත් අංශ

## 4.3 ක්‍රියාකාරකම් හා කාර්යක්ෂමතාවය

4.3.1 පුහුණු පාඨමාලා දිවයිනේ ප්‍රචලිත කිරිම සඳහා පියවර ගෙන තිබූ අතර තරුණ තරුණියන් සඳහා මැණික් විද්‍යා පාඨමාලාව කොළඹ හා රත්නපුර මධ්‍යස්ථාන තුල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පියවර ගන්නා ලදී.

අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ කාර්යයන්.

**4.4** <u>පුහුණු අංශයේ 2011 වර්ෂයේ ප්‍රගතිය</u>

ගෙවී ගිය වර්ෂයේදී ආයතනය මගින් කර්මාන්තයේ ඉල්ලුමක් සහිත පාඨමාලා රැසක් මෙහෙයවීමට පියවර ගනු ලැබිණි. මේ මගින් සත්‍ය වශයෙන්ම කර්මාන්තයේ නියැලෙන පුහුණු ශිල්පීන් බොහෝමයකට උසස් තාක්ෂණය හා ශිල්පීය දැනුම ලබා දීමට කටයුතු කරනු ලැබිණි. සහජ කුසලතා වලින් පිරිපුන් මෙම කණ්ඩායම ආයතනය මගින් ලබාගත් අධ්‍යාපනික පසුබිම මත දේශීය මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී ව්‍යාපාරයක් ලෙස මෙහෙයවීමට සමත් වනු ඇත.

1. 2011 වර්ෂයේ පුහුණු මධ්‍යස්ථාන 06 ක පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ලැබිණි. ඒ අනුව රත්නපුර, කොළඹ, මහනුවර, ගාල්ල, හම්බන්තොට, බුත්තල යන මධ්‍යස්ථානයන්හි කාර්යක්ෂමව කර්මාන්තයේ පුහුණු ඉල්ලුම ප්‍රාදේශීය වශයෙන් සැපිරීමට පියවර ගනු ලැබිණි.
2. අඩු ආදායම්ලාභී පවුල්වල කුසලතාවලින් යුත් තරුණ තරුණියන් මෙම ක්ෂේත්‍රයට යොමු කර ඔවුන් ස්වයං රැකියා ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමට මධ්‍යම පළාත් සභාව , ජාතික යොවුන් සේනාංකය, කැනඩා ලෝක විශ්ව විද්‍යාල සේවය (WUSC) යන බාහිර ආයතන වල අනුග්‍රහය ලබා ගැනීමට පියවර ගනු ලැබිණි.
3. 2011 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සහ ප්‍රදර්ශණයට සමගාමීව බුත්තල මැණික් කැපීම හා ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ පුහුණු ඒකකයක් කැනඩා ලෝක විශ්ව විද්‍යාල සේවය (WUSC) අනුග්‍රහය ඇතිව මෙම වර්ෂයේ ආරම්භ කරනු ලැබිණි. මේ මගින් මෙම ප්‍රදේශය තුල කර්මාන්තයට නූතන තාක්ෂණය දැනුම ලබා දීමේ අවකාශය සලස්වා ගනු ලැබිණි.
4. ස්වර්ණාභරණ නිෂ්පාදන පාඨමාලාව NVQ - 4 හා ස්වර්ණාභරණ ගල් බැඳීමේ පාඨමාලාව NVQ - 3 මට්ටමට ප්‍රතිගණනය කරනු ලැබිණි.
5. විලාසිතා ආභරණ සඳහා දේශීය වෙළඳපොළ දිනෙන් දින පුලුල් වන බව හඳුනාගත හැකිවේ. ඒ අනුව විලාසිතා ආභරණ නිෂ්පාදන ඒකකය දේශීයව ස්ථාපනයට දැනුම, තාක්ෂණය, කුසලතාවය ලබා දීම සඳහා එම පුහුණු පාඨමාලා හඳුන්වා දීමට පියවර ගනු ලැබිණි.
6. 2011 වර්ෂයේ ප්‍රධාන වැඩමුළු/ ප්‍රදර්ශණ 8 ක් සඳහා ආයතනය සෘජුවම දායක විය. මේ අනුව නවක නිර්මාණශිලි පුහුණු ලාභින් ක්ෂේත්‍රයට හඳුන්වා දීමට හා කර්මාන්තය ව්‍යාප්ත කිරීම, තාක්ෂණය හා දැනුම ලබා දීමට හැකි විය.

7. පුහුණු ඒකක සඳහා නව තාක්ෂණික මෙවලම් හඳුන්වා දීමට මූලික කටයුතු රාශියක් සිදු කරනු ලැබිණි. ඒ අනුව එම තාක්ෂණික භාවිතයන් 2012 වර්ෂයේ පුහුණු ඒකක සඳහා හඳුන්වා දීමට හැකි වේ.

8. 2011 වර්ෂය තුල ශිෂ්‍ය ලියාපදිංචිය හා පාඨමාලා සම්පූර්ණ කිරීම

8.1 ශිෂ්‍ය ලියාපදිංචිය

| පාඨමාලාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| රත්න විද්‍යාව | 36 |
| ගෙවුඩතාප පිරියම් කිරීම | 38 |
| මැණික් කැපීම හා ඔප දැමීම | 108 |
| මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අළෙවිකරණය | 57 |
| ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 31 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 58 |
| ආභරණ සඳහා ගල් බැඳීම | - |
| මුළු එකතුව | 328 |

2011 වර්ෂය තුල අවසන් කරනු ලැබූ පාඨමාලා සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ. මෙම අවසන් වු පාඨමාලා සමහරක් 2010 වර්ෂයේ ආරම්භ කරනු ලැබ ඇත.

| පාඨමාලාව | පාඨමාලාව අවසන් කල ශිෂ්‍ය සංඛාව |
|---|---|
| රත්න විද්‍යාව | 13 |
| ගෙවුඩ තාප පිරියම් කිරීම | 25 |
| මැණික් කැපීම හා ඔප දැමීම | 43 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අළෙවිකරණය | 72 |
| ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 30 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 21 |
| ආභරණ සඳහා ගල් බැඳීම | 8 |
| එකතුව | 212 |

මෙම වර්ෂය තුලදී 2011 වර්ෂයේදී ක්‍රියාවට නැංවෙන පහත කටයුතු සඳහා අවශ්‍ය මූලික කාර්යයන් රැසක් අතිරේක වශයෙන් ආවරණය කරනු ලැබිණි. එනම් පාඨමාලා නවිකරණය හා නව තාක්ෂණය හඳුන්වා දීම දේශිය අමුද්‍රව්‍ය භාවිතා කල හැකි හා නව නිර්මාණකරණයට අවශ්‍ය පාඨමාලා හඳුන්වා දීම හා පාඨමාලා ප්‍රතිතනනය කිරීමේ කටයුතු ඒ අතර ප්‍රධාන වේ.

## 4.5 මානව සම්පත් සංවර්ධනය

| | නම | පාඨමාලාව | වැඩමුළුව | ආයතනය |
|---|---|---|---|---|
| 01 | නලින් ජයසිංහ මයා | - | Human Talent Management | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 02 | කමල් බටගොඩ මයා<br>අනුර සමරවීර මයා | ඉගැන්වීමට විශිෂ්ඨයෙකු වන්න. | ඉගැන්වීමට විශිෂ්ඨයෙකු වන්න. | - |
| 03 | වසන්ත ගම්ලත් මයා<br>නලින් ජයසිංහ මයා | - | Build A WIning Organization | Skill Development Fund Limited |
| 04 | චාමිකා වික්‍රමාරච්චි මිය | - | Supervisor Management | Skill Development Fund Limited |
| 05 | අනුර සමරවීර මයා<br>කේ.පී. සුනිතා මිය | - | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණකරුවන්ගේ පුහුණු කිරීමේ වැඩසටහන | අපනයන සංවර්ධන මණ්ඩලය |
| 06 | කේ.වී.කේ. කුමාර මයා | ආරක්ෂිත විද්‍යාත්මක වාහන භාවිතය | - | ඉදිකිරීමේ අභ්‍යාස සහ සංවර්ධන ආයතනය |
| 07 | රත්නපුර ප්‍රධාන කාර්යාලයේ සිය!වම නිලධාරීන් | දෙමළ භාෂා පන්ති පැවැත්වීම | - | රත්නපුර ප්‍රධන කාර්යාලය |
| 08 | බුද්ධික ගුණරත්න මයා | Computer Training Certificate in Multimadia Package | - | IDM Affiliated Campus |
| 09 | ගර්ට් ලියනාරච්චි මිය<br>අනුර සමරවිර මයා<br>කමල් බටගොඩ මයා<br>රුසෙයිනා රශින් මෙනවිය | වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි සහතික පත් පාඨමාලාව | - | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය |

# පර්යේෂණ (ගවේශණ) ව්‍යාපෘති

## 1.0 ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේශණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය

මැණික් තැන්පතු සහ ඒවායේ විභවය හඳුනා ගැනීම, ස්වාභාවික හා සාමාජීය පරිසරයට සිදුවන බලපෑම අවමවන පරිදි තිරසාර ලෙස පතල් කැණීම සිදුකිරීමත් පතල් කර්මාන්තය මුහුණදෙන ප්‍රධාන අභියෝග වේ. මෙම අභියෝග ජය ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ලංකාව පුරා දියත්කර ඇති ව්‍යාපෘතිය මගින් නව මැණික් තැන්පතු හඳුනා ගැනීමත්, තිරසාර උපයෝජනයක් සඳහා විභවය හඳුනාගැනීමත් සිදුකෙරේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි රත්න විද්‍යාත්මක සිතියම් නිර්මාණයයි. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් හා අනුමැතිය ලබා ගැනීම සඳහා 2008 වර්ෂයේදී ව්‍යාපෘති යෝජනාව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී ආරම්භ කල අතර එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මහින්ද චින්තනය ප්‍රතිපත්තියට අනුව ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී ප්‍රදේශවලට මුලිකත්වය දෙමින් ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා බුත්තල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වලින් ආරම්භ විය. (රූපය 2)

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවසාන වාර්තාව හා මැණික් විභව සිතියම ප්‍රකාශයට පත්කර ඇත (රූපය 3,4). දැනට ප්‍රාථමික මැණික් හා ද්විතීක මැණික් නිධිවල පිහිටීම තහවුරු කිරීමේ ක්ෂෙත්‍ර ගවේශන වැල්ලවාය හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල සිදුකරගෙන යනු ලබයි. (රූපය 2)




රූපය 01. ක්‍රියාකාරි සැලැස්ම




රූපය *02.* 2011 වර්ෂය සඳහා අධ්‍යයන ප්‍රදේශය



රූපය *03.* පර්යේෂණ කණ්ඩායම පර්යේෂණ කටයුතුවල නිරත අවස්ථාවක්


DRAFT

Ministry of Environment | පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு

**Project on Exploration and Assessment of Gem Deposits in Sri Lanka**

**Progress Report**

**(From January, 2010 to October, 2011)**

GJRTI

**Gem and Jewellery Research and Training Institute**
**Hidellana, Rathnapura**
**Sri lanka**

රූපය 04. වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා පිළියෙල කල අවසාන වාර්තාවේ මුල් පිටුව




රූපය *05*. වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම

## 2.0 ලංකාවේ කළු ගඟ හා වලවේ ගඟ පෝෂක ප්‍රදේශ වල රත්රන් නිධි ගවේශණය හා තක්සේරු කිරිමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කළු ගඟ පෝෂක ප්‍රදේශයේ පිහිටි රත්රන් නිධි වලින් ඒ ආශ්‍රිත ඛණිජ වල පාෂාණ විද්‍යාත්මක, ඛණිජ විද්‍යාත්මක හා භූ රසායන විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යනයන් ඒවායේ ඇතිවීම, ඛණිජභවයේ යාන්ත්‍රනය සහ ආර්ථිකමය වටිනාකම තීරණය කිරිමත්ය. (රූපය *07.)*
ක්ෂෙත්‍ර සමීක්ෂණ නියැදි එකතු කිරීම සහ රසායනාගාර පරීක්ෂණ සාම්පල පිළියෙල කිරීම සිදුකර ඇත. (රූපය *08.)* මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සතුව පර්යේෂණාගාර පහසුකම් නොමැති බැවින් නියැදි පරීක්ෂා කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත යවා ඇත.




රූපය *06.* ක්‍රියාකාරි සැලැස්ම






රූපය *07*. අධ්‍යයන ප්‍රදේශය



රූපය *08*. නියැඳි එකතු කිරීම

**3.0 මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කොටස්කරුවන් මූලික කරගත් සම්පත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අවකාශීය දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමත්, ක්ෂේත්‍රයට අදාල පොත්පත් මිලදී ගැනීම, ක්ෂේත්‍රයට අදාල සඟරා පවත්වාගෙන යාම හා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කොටස්කරුවන්ට අවශ්‍ය විස්තර ලබාදීමත්ය.

පොත්පත් මිලදී ගැනීම සිදුකර ඇති අතර මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ අවකාශීය දත්ත ගබඩාව පවත්වාගෙන යනු ලබයි.



ෆයිසාල් රගින්
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ
හා අභ්‍යාස ආයතනය

## විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය

පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම් | | | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන | 18,714 | 20,228 | 25,321 | 25,885 | 27,420 |
| වෙනත් දායක වීම් | 3,325 | 6,289 | 5,330 | 8,322 | 12,500 |
| පාඨමාලා ගාස්තු | 5,392 | 5,597 | 2,614 | 2,397 | 3,256 |
| සේවා ගාස්තු ආදායම් | 36 | 45 | 22 | 24 | 25 |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **27,467** | **32,159** | **33,286** | **36,628** | **43,201** |
| වෙනත් ආදායම් | | | | | 44 |
| පොලී ආදායම | 1,002 | 151 | 69 | 159 | 166 |
| වෙනත් ලැබීම් | 2,289 | 404 | 194 | 164 | 205 |
| **මුළු ආදායම** | **30,758** | **32,714** | **33,750** | **36,952** | **43,616** |
| අඩු කලා - වියදම් | | | | | |
| ඒ සේවක හා පරිපාලන වියදම් | 27,144 | 29,119 | 26,504 | 28,629 | 30,328 |
| බී. ක්ෂය සහ පොදු වියදම් | 5,516 | 7,570 | 6,402 | 9,102 | 12,905 |
| **මුළු වියදම්** | **32,660** | **36,689** | **32,906** | **37,732** | **43,233** |
| අතිරික්තය (ඌණතාවය) | **-1,902** | **-3,975** | **644** | **-779** | **383** |

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

2011 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

| විස්තරය | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර | | 27,419.5 | | 25,885.0 |
| **වෙනත් ආදායම්** | | | | |
| පාඨමාලා ගාස්තු | | 3,255.5 | | 2,397.0 |
| ගෙවුඩ තාපකරණ ගාස්තු | | 25 | | 25 |
| භූ විද්‍යා පර්යේෂණ සේවා | | | | |
| පොළී ආදායම් | | 166.3 | | 159.1 |
| විවිධ ආදායම් | | 205.4 | | 164.4 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | **31,071.7** | | **28,630.50** |
| **අඩු කලා : මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්‍ය මණ්ඩල වැටුප් හා දීමනා | | 18,924.1 | | 17,972.9 |
| ගමන් වියදම් | | 437.5 | | 285.3 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | 1,743.6 | | 1,869.6 |
| නඩත්තු වියදම් | | 1,642.0 | | 1,155.3 |
| ගිවිසුම් ගත සේවා | | 6,467.8 | | 6,497.5 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | | 696.5 | | 468.8 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 393.3 | | 355.6 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | **30,304.8** | | **28,605.00** |
| **මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)** | | **766.8** | | **25.4** |
| අඩු කලා : මූල්‍ය පිරිවැය | | -22.7 | | -24.1 |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන | 6,458.6 | | 5,646.9 | |
| වෙනත් ලැබීම් | | | | |
| | 6,458.6 | | 5,646.9 | |
| අඩු කලා ක්ෂය කපා හැරීමේ වියදම් | 6,863.9 | -405.3 | 6,427.2 | -780.3 |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන | **6,040.9** | | **2,675.2** | |
| අඩු කලා ප්‍රාග්ධන ආයෝජන වියදම් | 5,723.4 | | 2,644.2 | |
| ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම් | 317.5 | | 31.0 | |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම | | | | |
| **මෙහෙයුම් නොවන ආදායම්** | | **-428** | | **-804.4** |
| එකතු කලා වත්කම් විකිණීමෙන් ලද ආදායම | | 44.2 | | - |
| අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතවය) | | 383.1 | | **-779** |
| අති විශේෂ අයිතම | | | | |
| කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය | | **383.1** | | **-779** |
| එකතු කලා | | | | |
| පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | -62,815.6 | | -62,016.7 | |
| අඩු කලා : පෙර වර්ෂ ගැලපීම් | 200.0 | -63,015.7 | 20 | -62,036.7 |
| ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) ඉදිරියට ගෙන ගියා | | **-62,632.6** | | **-62,815.6** |

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල යන්ත්‍ර උපකරණ | 26,916 | | 32,058 | |
| පාරිතෝෂික අරමුදල | 1,036 | 27,952 | 353 | 32,411 |
| විලම්භිත වියදම් | | | | |
| නවීකරණ සහ වෙන් කිරීමේ වියදම් | | | | 41 |
| ජංගම වත්කම් | | | | |
| තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 1,375 | | 1,393 | |
| අඩු කළා ලියා හැරීම් සඳහා වෙන් කිරීම | -648 | | -648 | |
| | 727 | | 745 | |
| විකිණීම සඳහා ඇති පොත් | 146 | | 176 | |
| කෙටිකාලීන ආයෝජන | | | | |
| ණය හා අත්තිකාරම් | 661 | | 736 | |
| බැංකු තැන්පතු ගිණුම් (කෙටිකාලීන) | 1,755 | | 1,619 | |
| තැන්පතු | 880 | | 890 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 47 | | 4,577 | |
| පෙර ගෙවීම් | 234 | | 52 | |
| මුදල් හා බැංකු | 12,726 | 7,177 | 108 | 8,905 |
| වත්කම් එකතුව | | 35,129 | | 41,357 |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 230 | | 106 | |
| උපචිත වියදම් | 3,419 | | 2,433 | |
| ණය හිමියෝ | 119 | | 119 | |
| උපයන විට ගෙවීම් බදු | 12 | 3,781 | | 2,658 |
| ජංගම නොවන වගකීම් | | | | |
| පාලන ගිණුම් (ජා. මැ. ස්. අධිකාරිය) | 3,179 | | 7,507 | |
| ප්‍රදාන - (වෙනත් ආයතන) | 162 | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 7,641 | | 7,224 | |
| සේවක ආරක්ෂක තැන්පතු | 10 | 10,993 | 10 | 14,741 |
| වගකීම් එකතුව | | 14,773 | | 17,399 |
| ශුද්ධ වත්කම් එකතුව | | **20,355** | | **23,958** |
| ශුද්ධ වත්කම් / ස්කන්ධ | | | | |
| සහභාගිත්ව ප්‍රාග්ධනය | | 50,000 | | 50,000 |
| සංචිත | | 3,000 | | 3,000 |
| වෙනත් දායක වීම් | | 850 | | 850 |
| සේවක වක්‍රිය අරමුදල | | 772 | | 750 |
| විලම්භිත ආදායම් / ප්‍රාග්ධන ප්‍රතිපාදන | | 28,365 | | 32,173 |
| සමුච්චිත අරමුදල | | -62,633 | | -62,816 |
| ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව | | **20,355** | | **23,958** |

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු('000)

| | 2011 | 2010 |
|---|---|---|
| මෙහෙයුම් කාර්යන්ගේ මුදල් ප්‍රවාහය | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත (ඌනතාව) | -428 | -804 |
| මුදල් නොවන ගනුදෙනු | | |
| ක්ෂය වෙන්කිරීම | 6,864 | 9,102 |
| විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම් | -12,500 | -8,322 |
| ගෙවීම් වැඩිවීම් | 1,123 | -3,966 |
| අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම | -4,166 | -495 |
| සේවක පිරිවැය සඳහා ප්‍රතිපාදන වල වැඩි වීම | 417 | 385 |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම | 3,727 | -487 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | |
| ප්‍රාග්ධන වියදම් කපාහැරීම් | 6,041 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ) | 1,078 | -4,589 |
| ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය | | |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | -1,307 | -3,961 |
| යන්ත්‍ර හා උපකරණ විකිණීම් වලින් ලැබීම් | -6,041 | -2,675 |
| ආයෝජන විකිණීම් වලින් ලැබීම් | 22 | 3,120 |
| යන්ත්‍ර හා උපකරණ විකිණීම් වලින් ලද ලාභ | 44 | |
| වත්කම් විකිණීම් | 129 | |
| ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ) | -7,152 | -3,516 |
| <u>මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය</u> | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 8,692 | 7,294 |
| රජයට විශේෂ අය වීම් | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) | 8,692 | 7,294 |
| මුදල් හා මූල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ) | 2,618 | -811 |
| ආරම්භක මුදල් /මූල්‍ය ශේෂය | 108 | 920 |
| වර්ෂය අවසානයේ මුදල් / මූල්‍ය ශේෂය | **2,726** | **108** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ටීඑම්/ජී/ජීජේආර්ටීඅයි/<br>එෆ්ඊ/2011 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2012 අගොසතු 21 දින |

සභාපති,
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) <u>වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ), වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපතිවරයා වෙත 2012 මැයි 14 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை.
INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA.

දුරකථනය / தொலைபேசி / Telephone: 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail: oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ(4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්</u>

2.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව වත්කම් මිලදී ගත් දින සිට ක්ෂය වෙන් කිරීම් සිදුකළ යුතු බව දක්වා, ඇතත් ආයතනය විසින් වත්කම් මිලදීගත් වර්ෂය සඳහා ක්ෂය කිරීම් සිදුකර නොතිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) බදු කුලී පදනම මත මහාභාණ්ඩාගාරයෙන් ලැබී ආයතනය නමින් ලියාපදිංචි කර ඇති රු.5,600,000 වටිනා කැබ්රථයක් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවා ඇති රු.185,000 ක දීමනා ගෙවිය යුතු දීමනාවක් ලෙසද ගිණුම් ගත කර තිබුණි.

(ඇ) බුත්තල සමුපකාර සංගමයෙන් ලබාගත් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා රු.461,542 ක් ගෙවීම දැයට කිරුළ ප්‍රදර්ශන වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) බුත්තල සමුපකාර සමිතියෙන් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා රු. 404,704 ක් වැය කර තිබු අතර ගිවිසුම ප්‍රකාරව මෙම මුදල හිලව් කළයුතු වේ. මෙය ගිණුම් සටහන්වලින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ)1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත 26(1) වගන්තිය | අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු විය යුතු බව දැක්වෙතත්, 2012 අප්‍රේල් දක්වාම අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කර නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත්කරන්නේ අමාත්‍යාංශය විසින් බැවින් මෙම පත් කිරීම කළමනාකරණයේ පාලනයෙන් තොර කාර්යක් බව සභාපතිවරයා දැනුම් දී ඇත |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.383,079 ක අතිරික්තයක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඌණතාවය රු.778,960 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,162,039 ක වර්ධනයක් විය. ප්‍රාග්ධන ප්‍රදාන සඳහා රු. 4,177,461 ක් ලැබීම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

ආයතනයේ සමුච්චිත අරමුදල අඛණ්ඩව සෘණ අගයන් පෙන්වන අතර 2008 වසරේ සිට 2011 වසර දක්වා එහි සෘන ශේෂයන් පිළිවෙලින් රු. 63,440,426 ක් රු. 62,016,683 ක්, රු. 62,815,644 ක් සහ රු. 62,632,591 ක් විය.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමණාකරණය

| ÷<ÁÙõ$ àùû$õ | &È´õ àùû$õ× | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| (à) í‘è´ àùû$õ× | 2:1 | 1.01 | 0.88 | 0.61 |
| (à$) ÷<ÁÙõ$ <õæÈ àùû$õ× | 1:1 | 1.70 | 3.06 | 1.21 |

ද්‍රවශීලතා අනුපාත විග්‍රහය අනුව ආයතනයේ මූල්‍ය තත්ත්වය අහිතකර බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මැණික් නිධි ගවේශණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය

1995 ජුලි 28 දිනැති ගැසට් නිවේදනයේ 05 ඡේදය අනුව ශ්‍රී ලංකාවේ මැණික් හා ඛණිජ සමීක්ෂණ හා පර්යේෂණ කිරීම ආයතනයේ ප්‍රධාන කාර්‍යයන්ගෙන් එකක් ලෙස දක්වා තිබුණි. මෙම කාර්ය සඳහා 2007 සිට 2010 දක්වා වසර 4 ක ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට රු. මිලියන 36 ක ප්‍රතිපාදන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය සඳහා වසරකට රු. මිලියන 9 බැගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒ ඒ වර්ෂ වල වැයකර ඇති ප්‍රතිශතය 2.06 සිට 45 අතර පරාසයක විය.

(ii) ව්‍යාපෘතියේ අරමුණ වසර 4 ක කාලය තුළ දිවයිනෙහි පළාත් 8 ක සමීක්ෂණ කටයුතු කිරීම සඳහා උපදේශන ලබා දීම වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සිදුකර ඇත්තේ මොණරාගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණ කටයුතු පමණි.

(iii) ව්‍යාපෘති යෝජනාවලියේ ප්‍රධාන අරමුණට අමතරව රට තුල පවත්නා නීති විරෝධී මැණික් ගැරීම, පාරිසරික ගැටළු හා භූ විද්‍යාත්මක ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට කටයුතු කළයුතු වුවද එවැනි පිලියම් හඳුන්වා දීමක් කර නොතිබුණි.

(iv) එක් පළාතක් සඳහා ඇස්තමේන්තුගත උපදේශක වියදම උපරිම රු.100,000 ක් වුවද, ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කය සඳහා පමණක් උපදේශක දීමනා ලෙස රු.765,000 ක් ගෙවා තිබුණි.

(ආ) පුහුණු පාඨමාලා පැවැත්වීම

වර්ෂ දෙකකට අදාලව පාඨමාලා පැවැත්වීමේ සිසු සහභාගීත්වය, පාඨමාලා ආදායම සහ උපදේශක ගාස්තු වියදම ඇස්තමේන්තුගත හා තථ්‍ය අගයන් පහත පරිදි විය.

| û$ñ´$Ù$< | &{þ$è < &&ù &‘ç]$< | | | |
|---|---|---|---|---|
| | 2011 | | 2010 | |
| | à`&õµÈùõ àè× | õö] àè× | à`&õµÈùõ àè× | õö] àè× |
| &<Ì ó$þØó µ´$&õØ ùÌ´$ó× | 80 | 31 | 40 | 30 |
| &<Ì ó$þØó ùÂû$÷ù× | 90 | 59 | 165 | 18 |
| à$þØó &ú{$ èÙ ý`ú´ | 10 | - | 10 | 07 |
| Øõù Ñ÷]$< | 50 | 36 | 60 | 38 |
| ´`óææ`û´ {$ åû÷`Ç´ | 70 | 106 | 80 | 55 |
| µè<ò õ$û ûÍ×È æÎ´ | 20 | 38 | 20 | 36 |
| ´`óæ<Ì ó µÁóèõ æÎ´ &{ àµÙÑæØó× | 40 | 57 | - | 45 |
| | 360 | 327 | 375 | 229 |
| äæõ< | | | | |
| û$ñ´$Ù$ à$÷$×´ (Ø`) | 6,370,000 | 2,440,010 | 9,030,000 | 2,397,000 |
| ãûµ÷Áù è$&õ (Ø`.) | 2,279,000 | 3,576,046 | 2,250,000 | 3,968,717 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය (පරිගණක ආශ්‍රිත) ස්වර්ණාභරණ සඳහා ගල් බැඳීම සහ රත්න විද්‍යාව (ඉංග්‍රීසි) යන පාඨමාලා සඳහා සිසුන් 50 ක් පුහුණු කිරීමට ඇස්තමේන්තු කර ඇතත් එම පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී වවුනියාව, කුලියාපිටිය, ත්‍රිකුණාමලය, මඩකලපුව යන ප්‍රදේශවල නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ඉලක්ක කර තිබූ නමුත් පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර නොතිබුණි. යාපනය කාර්මික විද්‍යාලයේ පුහුණු මධ්‍යස්ථානයක් 2008 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

(ඇ) 1995 ජූලි 28 දිනැති අංක 882 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් මෙම ආයතනයට පැවරී ඇති බලතල අනුව පතල් කැණීම්, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිලිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අදාළ මාතෘකා හා කරන ලද වැඩකටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පළකිරීම සිදුකළ යුතු වුවත් ආයතනය විසින් එකී බලතල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කැනඩා ලෝක විශ්ව විද්‍යාල සේවයේ ආධාර මත පාඨමාලා පැවැත්වීම, ගිවිසුම අනුව පුළුල් ප්‍රචාරණයක් මත අයදුම්පත් කැඳවා ඉලක්කගත 40% කණ්ඩායමක් ද ඇතුළුව පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවා ශිෂ්‍යයන් තෝරාගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර පුද්ගල හැඳුනුම් මත හා ඒ අවස්ථාවේ පවත්වාගෙන ගිය පාඨමාලාවක සිසුන් ඒ සඳහා යොමුකර තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු. 1,495,749 ක රන් සහ රිදී වංචාව නිසා සිදුවූ පාඩුව අයකර ගෙන නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ප්‍රකාරව සෑම මාසයකට වරක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ආයතනයේ කාර්ය සාධනය සමාලෝචනයට භාජනය කළයුතු වුවත්, ආයතනය විසින් 2011 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.3 ඌණ උපයෝජිත වත්කම්

2007 වර්ෂයේදී රු.12,309,013 ක පිරිවැයක් දරා භූ විදුම් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම යන්ත්‍රයෙන් නිසි ප්‍රයෝජන ලබාගෙන නොතිබුණි.

## 4.4 ආර්ථිකමය නොවූ ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරක්ෂක සේවා ලබාගැනීම සඳහා වූ රත්නපුර කාර්යාලයේ ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛණය අනුව ආරක්ෂක නිලධාරීන් 2 කු සේවය කළද නිලධාරීන් 3 දෙනෙකු සඳහා ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව, සේවා සපයා නොමැති පුද්ගලයෙකු සඳහා 2008 ජූලි 15 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.559,911 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ආ) කොළඹ, ගාල්ල, නුවර සහ බුත්තල මධ්‍යස්ථාන වල පිළිවෙලින් සිසුන් 54 ක්, 03 ක්, 23 ක් හා 45 ක් වූ අතර මෙම මධ්‍යස්ථාන අධීක්ෂණය සඳහා සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර 59 ක්,12 ක්,20 ක් හා 37ක් වශයෙන් මාස අටක් තුල පැමිණි බව සඳහන් කර තිබුණි'

(ඇ) කොළඹ මධ්‍යස්ථානය පවත්වාගෙනයාම

වටිනාකම රු. 263,409 වූ එකතුව ව.අඩි 503.87 වූ කාමර 3 ක් කිසිදු කාර්යකට යොදාගෙන නොතිබූ අතර වෙනත් මධ්‍යස්ථාන වලින් රැගෙන එන ලද යන්ත්‍ර හා උපකරණ පාවිච්චියකින් තොරව තැනින් තැන ගොඩ ගසා තිබුණි.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 133 ක් හා 44 ක් විය.

(ආ) සාවද්‍ය වැටුප් තලයක පිහිටුවා අධ්‍යක්ෂ ජනරාල් හට වැටුප් ගෙවීම හේතු කොටගෙන රු. 938,950ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැටුප් පරිවර්තන ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහයේ V11 පරිච්ජේදයේ 4.3, 4.4, 4.5 යන උපවගන්ති වලට අනුකූල විය යුතු වුවද එයට පටහැනිව සමස්ථ කාර්ය මණ්ඩලයේම වැටුප් සකසා තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී ආයතනයේ නිලධාරීන්ගේ වැටුප් වැඩිකිරීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.

4.6 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය සතුව වාහන 6 ක ඇණියක් පැවති අතර වාහන 2 ක් නිලවාහන ලෙස වෙන්කර තිබූ අතර වාහන 4 ක් සංචිත ලෙස පැවතුණි. ඉහත වාහන ඇණිය තුල කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව 3 ක් වූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 837,925 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ සභාපතිවරයා විසින් 2010 වර්ෂය සඳහා රු.550,000 ක්ද 2011 වර්ෂය සඳහා 252,000 ක් අනුමැතියකින් තොරව අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහයහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2010-2014 සංයුක්ත සැලැස්මේ ඉලක්ක අදාළ කාල සීමාව තුළදී අත්පත් කර නොතිබූ අතර සංශෝධනයන් නොකර එම ඉලක්ක හා උපාය මාර්ගයන්ම කාලසීමාව පමණක් වෙනස් කර 2011-2015 ස'යුක්ත සැලස්මට පිළියෙල කර තිබුණි.

5.2 ක්‍රියාකාර සැලැස්ම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කිරීමේදී වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් මොනවාද, ළගාවීමට අපේක්ෂිත ඉලක්ක ගත සංඛ්‍යාව කොතෙක්ද යන්න පිළිබඳව සඳහන් කර නොතිබුණු අතර, වර්ෂයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී ප්‍රතිශත අගයක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(ආ) ගෙවුඩ තාපකරණය සම්බන්ධයෙන් මොනරාගල දිස්ත්‍රික්කයෙන් ලබාගත් විවිධ වර්ගයේ ගෙවුඩ වල රසායනික සංයුතිය විශ්ලේෂණය කිරීම හා තාපකරණ මට්ටම හඳුනා ගැනීම වර්ෂය තුළදී කිරීමට නිශ්චිතව තිබුණ නමුත් එවැන්නක් සිදුකර නොතිබුණි.

(ඇ) කළුගඟ ප්‍රදේශයේ රත්රන් තිබීම පිළිබඳ පරීක්ෂාව

මෙහිදී වර්ග කි.මි. 1000 ක පරීක්ෂණ කටයුතු සිදු කිරීමට නියමිතව තිබූ නමුත් ප්‍රගතිය පිළිබඳව තොරතුරු ඉදිරිපත් නොවීය. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබාගත් තොරතුරු පදනම් කරගෙන පතල් වලින් ලබාගත් නියැදි 18 ක් ආයතනයේ රසායනාගාර පහසුකම් නොමැති නිසා භූ විද්‍යා හා පතල් කාර්යාංශය වෙත යවා තිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවූ අතර ඒ සඳහා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණනකගේ සේවය ලබාගෙන තිබුණි.

5.4 විගණන හා කළමණාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු 4 ක් පවත්වා තිබුණි.

5.5 අයවැය පාලනය

ඇස්තමේන්තු හා සත්‍ය ආදායම් හා වියදම් අතර 25% සිට 251% දක්වා සැලකිය යුතු විචලනයක් වුයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.6 වාර්ෂික වාර්තා

2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 අප්‍රේල් මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.7 තොග සමීක්ෂණය

හම්බන්තොට ස්වර්ණාභරණ නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවීම් උපකරණ 72 ක ඌනතාවයක් පැවති අතර කොළඹ කාර්යාලයේ රු.926,380 ක් වටිනා අභාවිත අයිතම 33 ක් ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුළත් කර නොතිබුණි. තවද වටිනාකම සඳහන් නොවූ අයිතම් 11 ක් ද ලේඛණගත කර නොතිබුණි. බුත්තල ව්‍යාපෘති කාර්යාලයේ පර්යේෂණ අංශයේ වටිනාකම සඳහන් නොවූ අයිතම 7 ක් ද ලේඛණගත කර නොතිබුණි.

06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පර්යේෂණ කටයුතු සිදු කිරීම

(ආ) වැටුප්

(ඇ) පාඨමාලා පැවැත්වීම

(ඈ) ආරක්ෂක සේවාවන් ලබාගැනීම.

(ඉ) භාණ්ඩ සමීක්ෂණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

# GJRTI














